සැ. යු. - 2011.07.15 දින පළ වූ අංක 1715 දරන ගැසට්පත්‍රයේ I - III, II සහ IV (අ) කොටස් පළනොවිය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,716 - 2011 ජූලි මස 22 වැනි සිකුරාදා - 2011.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1022 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1022 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1024 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.-* රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත 2011 ජූලි මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

කාර්මික ආරවුල් (සංශෝධන) පනත් කෙටුම්පත 2011 ජූලි මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූලි මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූලි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු — ඇබෑර්තු

### නිවැරදි කිරීමයි

### ජා-ඇල ප්‍රාදේශීය සභාව — කඳාන

2011.07.08 වැනි දින අංක 1714 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) පළාත් පාලනය - තනතුරු ඇබෑර්තු කොටසේ පළ වූ 07-224 දරන නිවේදනයේ :–

අනු අංක 03 හි රියදුරු II (ආ) තනතුරු සංඛ්‍යාව මුද්‍රණය වී නැති අතර එහි තනතුරු සංඛ්‍යාව "01ක්" ලෙසත් ;

අනු අංක 07 හි තනතුර විදුලි කම්බිකරු වශයෙන් වැරදි ලෙස මුද්‍රණය වී ඇති අතර, එය " විදුලි කම්කරු" ලෙසත් ;

අනු අංක 08 හි පුස්තකාල කම්කරු තනතුරු සංඛ්‍යාව 01ක් වශයෙන් වැරදි ලෙස මුද්‍රණය වී ඇති අතර එය "02ක්" ලෙසත් ;

අනු අංක 10 හි සෞඛ්‍ය කම්කරු තනතුරු සංඛ්‍යාව 03ක් වශයෙන් වැරදි ලෙස මුද්‍රණය වී ඇති අතර, එය '' 01 ක් '' ලෙසත් නිවැරදි විය යුතුය.

ඒ. එස්. ප්‍රේමදාස,
ලේකම්,
ජා - ඇල ප්‍රාදේශීය සභාව.

2011 ජූනි මස 23 වැනි දින,
කඳාන,
ජා - ඇල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

07-658

---

## පළාත් පාලන නිවේදන

### කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාල ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පල වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දන්වන අතර, ඉදිරියේ දී මෙම මාර්ගවලට අයත් ඉඩම්වලින් අදාල බිම් ප්‍රමාණය අත්පත් කර ගැනීමට කටයුතු යොදන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

චන්දන සිරිබද්දන,
සභාපති.

කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව,
කඹුරුපිටිය.

*කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව - මාර්ග ලියාපදිංචි කිරීම*

| *පාරේ නම* | *ග්‍රාම නිලධාරී වසම* | *දෙපස ඇති ඉඩම්* | | *ආරම්භය* | *අවසානය* | *දුර* | *පළල* |
|---|---|---|---|---|---|---|---|
| | | *වම* | *දකුණ* | | | *මීටර්* | *අඩි* |
| නිදන්ගල පරණ පාර | 331බී - කහගල ග්‍රාම නිලධාරී වසම | කැබලි අංක 81<br>කැබලි අංක 80<br>කැබලි අංක 79<br>කැබලි අංක 78 | කැබලි අංක 60<br>කැබලි අංක 61<br>කැබලි අංක 77<br>කැබලි අංක 76<br>කැබලි අංක 75 | යොවුන්ගම හරහා කහගල පාසල දක්වා ඇති පාර | කැබලි අංක 75 | මීටර් 750 | අඩි 22 |

| පාරේ නම | ග්‍රාම නිලධාරී වසම | දෙපස ඇති ඉඩම් වම | දකුණ | ආරම්භය | අවසානය | දුර මීටර් | පළල අඩි |
|---|---|---|---|---|---|---|---|
| වැලිහේන්ගොඩ පරණ පාර | 320ඒ-ගතාර නැගෙනහිර ග්‍රාම නිලධාරී වසම | එස්. අබේසිංහ මහතාගේ ඉඩම අයි. පී. ජයන්ත මහතාට අයත් ඉඩම, ජී. අනුරසිරි මහතාට අයත් ඉඩම ඩබ්. සී. එම්. ජයන්ත මහතාට අයත් ඉඩම | එස්. පී. රංජන මහතාට අයත් ඉඩම එච්. එස්. පී. අමරපාල මහතාට අයත් ඉඩම ඩබ්. අන්දරයස් මහතාට අයත් ඉඩම කොඩිප්පිලි මහතාට අයත් ඉඩම | ඩී. ජී. ජිනදාස මයාගේ නිවස අසල | එච්.එස්. සී. ආරියදාස මහතාට අයත් ඉඩම | මීටර් 500 | අඩි 14 |
| හිරිකැටියවත්ත පාර | 318ඒ- ගෝදාව ග්‍රාම නිලධාරී වසම | පහල මුලන කුඹුරුයාය | එගොඩවත්ත පාලුවත්ත හිරිකැටිය වත්ත | එගොඩහවත්ත නොහොත් කොහොඹගහ වත්ත | හිරිකැටියවත්ත | මීටර් 400 | අඩි 10 |
| ජය මාවත | 320බී-ගතාර බටහිර ග්‍රාම නිලධාරී වසම | ශාන්තිගෙවත්ත ඉඩම | 210 අනුර නිවස | ශාන්තිගෙවත්ත ඉඩම | 207බී නිවස | මීටර් 239 | අඩි 12 1/2 |
| සමගි මාවත හෙවත් ගොඩ පැලවත්ත පාර | 324 කරපුටුගල දකුණු ග්‍රාම නිලධාරී වසම | මහවත්ත 1 මහවත්ත 2 ගොඩපැලවත්ත 1 ගොඩපැලවත්ත 2 | මහවත්ත 1,2ඉඩම ගොඩපැලවත්ත 1,2 ඉඩම් | සිරිධම්මරතන මාවතේ මහ පන්සල අසල ප්‍රධාන බෝක්කුව අසල සිට | ඔලින්නහේන හරහා ධම්මාලෝක මාවත | මීටර් 500 | අඩි 16 |
| හොරකුට්ටිය බටුහේන මාර්ගය | 324ඒ කරපුටුගල උතුර ග්‍රාම නිලධාරී වසම | නමාමිය දොල රජයේ ඉඩම හොරකුට්ටියහේන ඇල්හේන ලියන්ගස් පාර | නමාමිය දොල රජයේ ඉඩම හොරකුට්ටියහේන බටුහේන | නමාමියදොල | බටුහේනවත්ත | මීටර් 570 | අඩි12 |
| පුබුදු මාවත | 317බී කරගොඩ උයන්ගොඩ | රජයේ ඉඩම් | රජයේ ඉඩම් | කේ. ජී. පීටර්අප්පු හාමු මහතාගේ නිවස අසල සිට | නෙරංජන් ගමගේ මහතාගේ නිවස අසල | මීටර් 500 | අඩි 25 |
| අරඹේ මාවත | 321 මලාන | අයි. එච්. ධර්මදාස මහතාගේ ඉඩම මැදගෙදර ඉඩම පාළුවත්ත ඉඩම අරඹවත්ත ඉඩම චන්දන සිරිබද්දන මහතාගේ ඉඩම ධර්මසේන සිරි බද්දන මහතාගේ ඉඩම සරත් සිරිබද්දන මහතාගේ නිවස | ගුරු ගෙදර ඉඩම වික්‍රම මහතාගේ ඉඩම රත්නායක මහතාගේ ඉඩම දයාවතී මහත්මියගේ ඉඩම විමලා වික්‍රමආරච්චි මහත්මියගේ ඉඩම ඩබ්. ඒ. සිරිසේන මහතාගේ ඉඩම සුගතදාස ගුණසේකර මහතාගේ ඉඩම රංගොඩගේ මහත්මියගේ ඉඩම අරඹගෙදර ඉඩම චන්ද්‍රසේන සිරිබද්දන මහතාගේ ඉඩම | කඹුරුපිටිය කිරින්ද පාර | සරත් සිරිබද්දන මහතාගේ නිවස | මීටර් 700 | අඩි 12 |

07-492

# අතුරු ව්‍යවස්ථා

## සම්මත අතුරු ව්‍යවස්ථාවක් පිළිගනු ලැබූ බව ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනය

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

**අලව්ව ප්‍රාදේශීය සභාව - අලව්ව**

261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභාව විසින් 2011.06.30 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව.

2011 ජූලි මස 07 වැනි දින,
අලව්ව දී ය.

*උපලේඛනය*

*සම්මත අතුරු ව්‍යවස්ථාවක් පිළිගැනීම සඳහා පළාත් පාලන ආයතනයක් විසින් මහා සභාවට ඉදිරිපත් කළ යෝජනාවේ ආදර්ශය :*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික පනතේ 02 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරනු ලැබූ වයඹ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2011.04.28 වැනි අංක 1703/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ප්‍රාදේශීය සභාවල අප්‍රසන්න, අන්තරාදායක සහ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් කටයුතු සංචාරක වෙළඳාම් ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම, ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම, ලැගුම් නිවාස හා නවාතැන් පලවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ අලව්ව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

මෙම යෝජනාව ඒකමතිකව සම්මත වූ අතර, *ගැසට් නිවේදනයේ* පළ වන දින සිට අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක වේ.

07-587

---

## සම්මත අතුරු ව්‍යවස්ථාවක් පිළිගනු ලැබූ බව ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනය

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

**නාරම්මල ප්‍රාදේශීය සභාව - නාරම්මල**

261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව නාරම්මවල ප්‍රාදේශීය සභාව විසින් 2011.06.28 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සභාපති,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2011 ජූනි 07 වැනි දින,
නාරම්මල දී ය.

*උපලේඛනය*

සම්මත අතුරු ව්‍යවස්ථාවක් පිළිගැනීම සඳහා පළාත් පාලන ආයතනයක් විසින් මහ සභාවට ඉදිරිපත් කරන යෝජනාවේ ආදර්ශය :

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික පනතේ 02 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2003.11.28 වැනි දින අංක 1630 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස් පළ කරනු ලැබූ නිවාස දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ නාරම්මල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

මෙම යෝජනාව ඒකමතිකව සම්මත වූ අතර, *ගැසට් නිවේදනයේ* පළ වන දින සිට නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක වේ.

07-610

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.